Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව
## සති පාසල

විෂය - පෙරදිග සංගීතය

ශ්‍රේණිය - 9

ඔක්තොම්බර් මාසය - 2 සතිය

සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති
ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් සතුට හා බැඳි මානසිකත්වයන් ළගා කර ගැනීමට හුරුවෙයි.**

**නිපුණතා මට්ටම 3.1 : ජන සංගීතය ආශ්‍රයෙන් නිර්මාණය කළ ගීත විමසයි.**

**ක්‍රියාකාරකම 3.1.1 : *ජන ගී ආශ්‍රිත සරල ගී***

**ඉහත 3.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02 පැවරුම් සම්පූර්ණ කරන්න.**

පැවරුම 01 - i. නිර්දේශිත ජන ගී ආශ්‍රිත සරල ගී පහත සබැඳිය ඔස්සේ ශ්‍රවණය කරන්න.

- දෑතට වළලු - නීලා වික්‍රමසිංහ/වී.එම්.ජයරත්න ශිල්පීන් → https://youtu.be/KUtGpQOL0zM
- මල්සරා බැල්ම හෙලා - රෝහණ බැද්දගේ මහතා → https://youtu.be/vxaqGX5S-aE
- වන්නම් සවිදම් - ලයනල් රන්වල මහතා → https://youtu.be/c5EQ0a-7moA

ii. පහත දක්වෙන ගී පද මාලා නිවැරදි ව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.


වන්නම් සවිදම් ගායන
සූරිය මණ්ඩල සේමා
ගයමුව යාළුවී මා හා //

ඉහළ ගමින් කෝ වරෙල්ලා
වරෙල්ලා යාළු පනේ
පේරැස් මුදුවේ බලල්ලා
බලල්ලා දිස්නෙ නගෝ
මහා බඹා මැවූ රන් පබාවතී ළඳ දෝ
මහා බඹා මැවූ රන් පබාවතී ළඳ දෝ
මහා බඹා මැවූ රන් පබාවතී ළඳ දෝ

වන්නම් සවිදම් ගායන
සූරිය මණ්ඩල සේමා
ගයමුව යාළුවී මා හා //

කණට දෙබික්කං පයට පදක්කං
මම දෙඤ්ඤා මම දෙඤ්ඤා
කණට දෙබික්කං පයට පදක්කං
මම දෙඤ්ඤා මම දෙඤ්ඤා
ආලවන්තයා මං බහක් දියන් නංගෝ
ආලවන්තයා මං බහක් දියන් නංගෝ
ආලවන්තයා මං බහක් දියන් නංගෝ

වන්නම් සවිදම් ගායන
සූරිය මණ්ඩල සේමා
ගයමුව යාළුවී මා හා //


දෑතට වළලු මල් මුතුවැල් මාල පොටයි
යායට වළලු පුන් සුසුමින් සේ බැබළෙයි
දෑතට වළලු මල් මුතුවැල් මාල පොටයි
යායට වළලු පුන් සුසුමින් සේ බැබළෙයි

පද - සී. ද. එස්. කුලතිලක
ස්වර - සී. ද. එස්. කුලතිලක
ගැයුම - නීලා වික්‍රමසිංහ


මල් සරා බැල්ම හෙළා මගේ හිතට කොඳුරනවා
රන්මලී දැක්ක ගමන් මල්වාරම් කියවෙනවා
හිත බඳ සෙනේ මම් පවසම්ද කොයි ලෙසින්
රන්මලී.....
මල් සරා බැල්ම හෙළා මගේ හිතට කොඳුරනවා
රන්මලී දැක්ක ගමන් මල්වාරම් කියවෙනවා

තිස්සෙම ගම සුවඳ කරන් පිපුණා කිණිහිරිය මලේ
විස්තර දුටුවද බඹරුනි පිපිලා දොඹ මුතු කැකුලේ
ලස්සන හුරුබුහුටි කමට දිලෙනා දැතින් මකලී
ඉස්සර මගේ කලට පිනේ පිපුණා බල ලඳ කෝමලී
ඉස්සර මගේ කලට පිනේ පිපුණා බල ලඳ කෝමලී

මල්සරා බැල්ම හෙළා ..../

ලස්සන ගුණ කනක හරණ සවන් පැළඳි පොල්ල ම
ඇස් නිළුපුල් පෙති ගෝමර ගෙළවට ගෙලි රුවන් ම
ගොස් උයනේ මගේ පැළට එළිය දෙන්න පිපුණු මලී
වැස්ස ළඟයි බක් මාසේ මා සනසපන් කොමලී
වැස්ස ළඟයි බක් මාසේ මා සනසපන් කොමලී

මල් සරා බැල්ම හෙළා ..../

iii. හැකි නම් ස්වර පුවරුවක් ආධාරයෙන් හෝ ඉහතින් ඔබට ලබා දී ඇති link ආධාරයෙන් නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීත ගායනයට හුරු වන්න.

පැවරුම 02

i. e තක්සලාව, e නැණපියස වෙබ් අඩවි හරහා හෝ අන්තර්ජාලයේ ඇතුළත් ජන ගී ආශ්‍රිත සරල ගී ශ්‍රවණය කරන්න.

"ජන ගී ආශ්‍රිත සරල ගී" යන මාතෘකාව ඇසුරින් ම සිසු දරු දැරියන් සඳහා නිර්මාණය වී ඇති වීඩියෝ පාඩම් මාලාවක් අන්තර්ජාලයේ වන අතර ඒවා සොයා බලා තොරතුරු රැස් කොට ගෙන පහත ආකෘතිය අනුව පොත් පිංචක් සකසන්න. පරිශීලනයට යොමුවන්න.

| සරල ගීතය | ගායකයා /ගායිකාව | ආශ්‍රිත ජන ගී වර්ගය |
|---|---|---|
| | | |